*සැ. යු.*– 2007.04.27 වැනි දින අංක 1,495 දරන *ගැසට් පත්‍රයෙහි* IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,496 - 2007 මැයි 04 වැනි සිකුරාදා - 2007.05.04

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 398 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 392 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 398 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 394 | විවිධ දැන්වීම් ... ... ... | — |


(i) *සැ. යු.*– ලංකා හෝටල් සංස්ථා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත 2007 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) හෙවිජ් භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල (පැවරීමේ) පනත් කෙටුම්පත 2007 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 මැයි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය – තඹුත්තේගම

තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ විස්තර කර ඇති භාණ්ඩ 2007.05.26 වැනි සෙනසුරාදා දින පෙරවරු 9.30 ට තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙම වෙන්දේසිය සඳහා ඉදිරිපත් කර ඇති කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන තැනැත්තකු සිටී නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ පෙරවරු 8.30 සිට පෙරවරු 9.30 දක්වා එකී අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබාගෙන පෙරවරු 8.30 සිට පෙරවරු 9.30 දක්වා වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැකිය.

04. වෙන්දේසියේ දී මිළදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින් පමණක් ගෙවීම් කළ යුතුය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

05. වෙන්දේසියේ දී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී තම ජාතික හැඳුනුම්පත අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතුය.

06. මිළ දී ගන්නා සියලුම භාණ්ඩ වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ පස්වරු 04.00ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ඒ. එම්. ඒ. වසන්ත කුමාර,
මහෙස්ත්‍රාත්,
තඹුත්තේගම.

2007 අප්‍රේල් මස 10 වැනි දින,
තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

### වෙන්දේසියට අදාල භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 01. | B88/01 | දිග අඩි 17.5 දිග කොළ පාට ඔරුවක් |
| 02. | 67801 | රතුපාට ලොකු හයිඩ්‍රොලික් ජැක් එකක්<br>යකඩ තාච්චි 01<br>පිකස් 01<br>අලවංගු 02<br>කිඹුලා උදලු 01 |
| 03. | 67704 | දම්වැල් කියත් 01 |
| 04. | 67705 | දම්වැල් කියත් 01 |
| 05. | 51871 | දම්වැල් කියත් 01 |
| 06. | 39303 | ඉරුම් කියත් 01 |
| 07. | 61085 | ඉරුම් කියත් 01 |
| 08. | 65105 | ඉරුම් කියත් 01 |
| 09. | 69729 | බංඩි කියත් 01<br>පොරොව 01<br>පීරි 01 |
| 10. | 69731 | පොරොව 02<br>වක් පිහි 01 |
| 11. | 66822 | කැති 04<br>පොරොව 01 |
| 12. | 61670 | පොරොව 02 |
| 13. | 64956 | කුළු ගෙඩි 03<br>අලවංගු 01 |
| 14. | 64657 | ගෙවි ගිය උදලු 01<br>අලවංගු 01<br>කුළු ගෙඩි 02 |
| 15. | 54099 | රවුම් කියත් සමග ඉරුම් බංකු 01 |
| 16. | 36653 | ඉරුම් කියත් 02 |
| 17. | 55757 | ලී ඉරන යන්ත්‍ර 01 |
| 18. | A508/05 | ගෑස් සිලින්ඩර් 01<br>ගෑස් උදුන් 01<br>රෙගුලේටර් 01 |
| 19. | A630/05 | ප්ලාස්ටික් සවල් 10 බැගින් ඇති පැ. 15ක් |
| 20. | 65101 | රිකෝන් වර්ගයේ විදුලි ස්ත්‍රික්ක 01 |
| 21. | 65104 | විදුලි කේතල 01 |
| 22. | - | නඩු අංකය අපැහැදිලි අංක හා වර්ග අපැහැදිලි පාපැදි 10 |
| 23. | 801/04 | අංක 555040034 දරන වර්ගය අපැහැදිලි පා පැදිය<br>අංක 112639 දරන වර්ගය අපැහැදිලි පා පැදිය<br>ASB යනුවෙන් අංක වර්ගය අපැහැදිලි පා පැදිය |
| 24. | 41093 | ලුමාලා වර්ගයේ අංක 55687406 දරන රතුපාට පා පැදිය |
| 25. | A953/05 | අංක අපැහැදිලි ලුමාලා වර්ගයේ පා පැදිය |
| 26. | A952/05 | අංක 55961587 ලුමාලා වර්ගයේ නිල්පාට පා පැදිය |
| 27. | A951/05 | අංක 0763028 දරන හීරෝ වර්ගයේ කොළ පාට පා පැදිය |
| 28. | 35594 | අංක 55688840 ලුමාලා වර්ගයේ නිල් පාට පාපැදිය |
| 29. | 35592 | අංක Q280379 දරන හීරෝ වර්ගයේ නිල් පාට ස්පෝට් පාපැදිය |
| 30. | 35589 | අංක 55400596 දරන ලුමාලා ස්පෝට් පාපැදිය |
| 31. | 35600 | අංක 55901015 දරන ලුමාලා ස්පෝට් පාපැදිය |
| 32. | A563/06 | අංක 55312733 දරන ලුමාලා ස්පෝට් පාපැදිය |
| 33. | A564/06 | අංක 077795 දරන හීරෝ වර්ගයේ මවුන්ටන් පාපැදිය |
| 34. | A562/06 | අංක 02172886 දරන වර්ගය අපැහැදිලි පාපැදිය |
| 35. | A286/05 | අංක A163576 දරන හීරෝ වර්ගයේ රතු දම් මිශ්‍ර පා පැදිය<br>අංක 577296 දරන හීරෝ වර්ගයේ පා පැදිය<br>අංකය අපැහැදිලි "සන්ඩර්" වර්ගයේ පාපැදිය<br>අංක JK 010864 දරන නිල් පාට මවුන්ටන් වර්ගයේ පාපැදිය |
| 36. | 36743 | අංක NW GA 3436 දරන හොණ්ඩා 90 වර්ගයේ යතුරුපැදිය |
| 37. | A154/05 | අංක 5505640 දරන රලේ වර්ගයේ පාපැදිය |
| 38. | A155/05 | අංකය අපැහැදිලි රෝඩ්මාස්ටර් වර්ගයේ නිල් පාට පාපැදිය |
| 39. | A156/05 | අංක RL1298 (තරමක් අපැහැදිලි) දරන නිල්පාට ස්පෝට් පා පැදිය |

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* |
|---|---|---|
| 40. | A669/04 | එන්ජින් අංක DFFBJE 44896 හා චැසි අංක Dfmbje 88403 දරන බජාජ් බොක්සර් වර්ගයේ යතුරු පැදිය |
| 41. | A830/04 | අංක 91 ශ්‍රී 7740 දරන හොණ්ඩා සුපර් කබ් වර්ගයේ ඉතා අබලන් යතුරු පැදිය |
| 42. | 50017 | අංක ENH 3147 FMA 23400049 දරන හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය |
| 43. | 47406 | තඹතත් 10M (වයර්) |
| 44. | 49649 | තඹතත් 10M (වයර්) විදුලි බුබුළු 01, හෝල්ඩර් 01 |
| 45. | 59790 | තඹතත් 10M (වයර්) |
| 46. | 63019 | තඹතත් 10M (වයර්) බහු ජේනු 01 |
| 47. | 61067 | තඹතත් 37M (වයර්) විදුලි බුබුළු 01, හෝල්ඩර් 01 |
| 48. | 66770 | සේවා වයර් 40 M |
| 49. | 61067 | තඹතත් 10M (වයර්)විදුලි බුබුළු 01, හෝල්ඩර් 01 |
| 50. | 61066 | තඹතත් 100M (වයර්)විදුලි බුබුළු 01, හෝල්ඩර් 01 |
| 51. | 65192 | වයර් 14M |
| 52. | 63024 | තඹතත් 30M (වයර්)විදුලි බුබුළු 01, හෝල්ඩර් 01 |
| 53. | 64274 | තඹතත් 35M (වයර්)විදුලි බුබුළු 01, හෝල්ඩර් 01 |
| 54. | 64275 | තඹතත් 20 M (වයර්)විදුලි බුබුළු 01, හෝල්ඩර් 01 |
| 55. | 64278 | තඹතත් 18M (වයර්)විදුලි බුබුළු 01, හෝල්ඩර් 01 |
| 56. | 64280 | තඹතත් 30M (වයර්)විදුලි බුබුළු 01, හෝල්ඩර් 01 |
| 57. | 67072 | සවල් 01 |
| 58. | 66456 | සවල් 01<br>උදළු 01<br>බාල්දි 01 |
| 59. | 67073 | බාල්දි 01 |
| 60. | 67069 | සවල් 01 |
| 61. | 60067 | සවල් 04<br>උදලු 01 |
| 62. | 67071 | සවල් 01 |
| 63. | 67068 | බාල්දි 01 |
| 64. | A1175/0 | සෙවිලි තහඩු 06 |
| 65. | - | බැරල් තොගයක් |
| 66. | - | විවිධ ප්‍රමාණයේ ප්ලාස්ටික් බූලි තොගයක් |
| 67. | - | විවිධ ප්‍රමාණයේ වීදුරු බෝතල් තොගයක් |

05-89

---

## නොච්චියාගම සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය

### නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නොච්චියාගම සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ විස්තර කර ඇති භාණ්ඩ 2007.05.27 වැනි ඉරිදා දින පෙරවරු 9.30ට නොච්චියාගම සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙම වෙන්දේසිය සඳහා ඉදිරිපත් කර ඇති කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන තැනැත්තකු සිටී නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ පෙරවරු 8.30 සිට පෙරවරු 9.30 දක්වා එකී අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබාගෙන පෙරවරු 8.30 සිට පෙරවරු 9.30 දක්වා වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැකිය.

04. වෙන්දේසියේ දී මිළදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින් පමණක් ගෙවීම් කළ යුතුය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

05. වෙන්දේසියේ දී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී තම ජාතික හැඳුනුම්පත අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතුය.

06. මිළ දී ගන්නා සියලුම භාණ්ඩ වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ පස්වරු 04.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ඒ. එම්. ඒ. වසන්ත කුමාර,
මහෙස්ත්‍රාත්,
තඹුත්තේගම.

2007 අප්‍රේල් මස 10 වැනි දින,
තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

*වෙන්දේසියට අදාල භාණ්ඩ ලැයිස්තුව*

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* |
|---|---|---|
| 01. | B608/06 | අඩි දෙකක විශ්කම්භයක් ඇති ඉරුම් කියත සමග ඉරුම් බංකු 01 |
| 02. | 46985 | අංක 72-8679 දරන K75 වර්ගයේ අත් ට්‍රැක්ටරය<br>ඉරුම් කියත් 01<br>පොරව 01 |
| 03 | 61861 | ඉරුම් කියත් 02<br>පොරොව 01 |
| 04. | 53547 | ඉරුම් කියත් 01<br>හරස් කියත් 01 |
| 05. | 54498 | ඉරුම් කියත් 01<br>පොරොව 01<br>අංක 6842725 දරන පාපැදිය |
| 06. | 68068 | අංක 02 A 0972 දරන පාපැදිය |
| 07. | 45958 | වර්ගය හා අංකය අපැහැදිලි අබලන් පා පැදිය |
| 08. | 39904 | අංක K 575464 දරන හීරෝ වර්ගයේ අබලන් පාපැදිය |
| 09. | - | තඹ තත් (වයර්) තොගයක් |
| 10. | - | සවල් කීපයක් |
| 11. | - | බාල්දි 03 |
| 12. | - | බැරල් තොගයක් |
| 13. | - | විවිධ ප්‍රමාණයේ ප්ලාස්ටික් බූලි තොගයක් |
| 14. | - | විවිධ ප්‍රමාණයේ වීදුරු බෝතල් තොගයක් |
| 15. | 64690 | පොරව 02<br>කැති 01 |
| 16. | A827/04 | අංක R 95310 දරන වර්ගය අපැහැදිලි පා පැදිය<br>අංක 04 ER 2734 දරන නිල් පාට ර්ට්න් වර්ගයේ පා පැදිය |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| | | අංක R 103318 දරන හීරෝ වර්ගයේ කළු පාට පාපැදිය |
| | | අංක 99G15433 දරන ලුමාලා වර්ගයේ ස්පෝට් පාපැදිය |
| | | අංක 4G02382 දරන වර්ගය අපැහැදිලි පාපැදිය |
| | | අංක BH4602 දරන ර්විත් වර්ගයේ පාපැදිය |
| 17. | A 829/04 | අංක KH 668 දරන එරික්සන් වර්ගයේ ජංගම දුරකථනය |
| 18. | - | කැති කීපයක් |
| 19. | - | උදළු 02 |
| 20. | 67771 | දම්වැල් කියත් 01 |

05-90

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### රා තැබැරුම් රේන්ද විකිණීම - 2007/2008

2007 ජූලි මස 01 දින සිට 2008 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබැරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙන් දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාල ටෙන්ඩරයේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් 15%ක වටිනාකමට ලබාගත් වත්කම් සහතිකයක් ද ඊට ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ............. දරන .................... රා තැබැරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබැරුමේ අංකය සහ නම සඳහන් කර 2007 මැයි මස 14 වැනි දින පෙ. ව. 10.00 ට පෙර හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. *නැතහොත්* එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. *ටෙන්ඩර් ඉදිරිපත් කිරීම.*– 1982.08.20 දින පළ වී ඇති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුයි.

05. 2007.05.14 වැනි දින පෙ. ව. 10.00ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම, අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පෙනී සිටිය හැකිය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වන රා තැබැරුම් නැවත විකිණීම 2007.05.28 වැනි දින පෙ. ව. 10.00ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය. (දුරකථන අංකය : 032-2223205).

එස්. ශානිකා රෝෂනී,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
හලාවත ප්‍රාදේශීය ලේකම් *වෙනුවට.*

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
හලාවත.

උපලේඛනය

| අනු අංකය | කොට්ඨාසය | ග්‍රාමය/තැබෑරුම | ටෙන්ඩර් භාර ගන්නා දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|
| 01. | හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 02 දරන කොට්ඨාසය | ඉච්චම්පිටිය | 2007.0514 පෙ. ව. 10.00 | 2,000 |
| 02. | හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 03 දරන කොට්ඨාසය | අළුත්වත්ත | 2007.0 5.14 පෙ. ව. 10.00 | 1,000 |
| 03. | උතුරු පිටිගල් කෝරළය | ඔළිදළුව | 2007.05.14 පෙ. ව. 10.00 | 250 |

05-46

---

## කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2007/2008 වර්ෂය 2007 ජූලි සිට 2008 ජුනි දක්වා

2007ජූලි මස 01 සිට 2008 ජුනි මස 30 දක්වා මාස 12 ක කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජන රජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයක් ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිළ ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි අංක .............. දරන ............. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2007.05.11 වැනි දින පෙ. ව. 10.00 ට පෙර කල්පිටිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර කල්පිටිය ප්‍රාදේශීය ලේකම් මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2007.05.11 වැනි දින පෙ. ව. 10.00ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියළුම ටෙන්ඩර්කරුවන් කල්පිටිය ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2007.05.25 වැනි දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එම්. කේ. මුහයීස්,
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

2007 අප්‍රේල් මස 12 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| අනු අංකය | කොට්ඨාසය | ග්‍රාමය | තැබෑරුම | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|---|
| 01. | කල්පිටිය | දළුව | රා | 2007.05.11 පෙ. ව. 10.00 | 1,000 |
| 02. | කල්පිටිය | ඒත්තාල | රා | 2007.05.11 පෙ. ව. 10.00 | 1,000 |

05-05

---

## වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

### රා තැබෑරුම් රේන්ද විකිණීම - 2007/2008

2007 ජූලි මස 01 දින සිට 2008 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයක් ම අදාලව එවකට පවත්වන කොන්දේසි මාලාවන්ට යටත්ව පහත දැක්වෙන උපලේඛණයෙහි සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් බාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු වන අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් හා අදාල ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15%ට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ............. දරන .................... රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුම් අංකය සහ නම සඳහන් කොට 2007 මැයි 11 සිට 2007 මැයි 17 වැනි දින පෙ. ව. 10.00 ට පෙර වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පනවා ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙන්* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුයි.

05. 2007.05.17 වැනි දින පෙ. ව. 10.00ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම, අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියළුම ටෙන්ඩර් කරුවන් වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි රා තැබෑරුම් නැවත විකිණීම 2007.06.01වැනි දින පෙ. ව. 10.00ට සිදු කරනු ලැබේ. එදින ද ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ සඳහා අවශ්‍යතාවන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එම්. සී. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
වෙන්නප්පුව.

උපලේඛනය

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ග්‍රාමය | තැබෑරුම් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|
| 01. | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | තඹරවිල | 2007.05.17 පෙ. ව. 10.00 ට | 500 |
| 02 | එම | නත්ජුන්ඩර්කරේ | එම | 250 |
| 03. | එම | වයික්කාල | එම | 1,000 |
| 04. | එම | බොරලැස්ස | එම | 500 |
| 05. | එම | දුම්මලදෙනිය | එම | 1,000 |
| 06. | එම | උල්හිටියාව | එම | 500 |
| 07. | එම | ලුණුවිල | එම | 500 |
| 08. | එම | වෙන්නප්පුව | එම | 2,000 |
| 09. | එම | නයිනමඩම | එම | 1,000 |

| තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වැසිය යුතු වේලාව |
|---|---|
| පෙ. ව. 11..00 ට | ප. ව. 2.00 |
| ප. ව. 5.00 ට | ප. ව. 8.00 ට |

05-47

---

## රා තැබෑරුම් රේන්ද විකිණීම - 2007/2008 වර්ෂය

2007 ජූලි මස 01 සිට 2008 ජූනි මස 30 දක්වා

පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2007 ජූලි මස 01 දින සිට 2008 ජුනි 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වන දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයක්ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සැළසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ අංක .................................................................................... දරන........................................................................ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කොට 2007.05.10 දින පෙ.ව. 10.00 ට පෙර පුත්තලම ප්‍රාදේශීය ලේකම් ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර පුත්තලම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වෙනි දින පල වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුලත් විය යුතුය.

05. 2007.05.10 දින පෙ.ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර් කරුවන් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඒ. සී. එම්. නෆීල්,
ප්‍රාදේශීය ලේකම්/පුත්තලම.

උපලේඛනය

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ග්‍රාමය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|---|
| 01 | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සේනකුඩිරිප්පුව | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව.2.00<br>රාත්‍රී 8.00 | 2007.05.10<br>පෙ.ව. 10.00 | රු. 1,000 |

ඒ. සී. එම්. නෆීල්,
පුත්තලම ලේකම් - පුත්තලම.

2007 අප්‍රේල් මස 16

02-69

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## විශේෂ ඇටෝර්නි බලකරය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, ශ්‍රී ලංකාවාසී මහජනතාවටත් දන්වා ප්‍රකාශ කර සිටින්නේ ඔස්ට්‍රියාවේ වියානා හි ගාර්ට්නර්ගසේ 1030 හි පදිංචි දැනට මහනුවර මාවිල්මඩ පාරේ අංක 26/9 හි පදිංචි රෙමිගියෝ පලෝනි (ඉතාලි පාස්පෝට් අංක 431524 x P ) වන මම වර්ෂ 1999ක් වූ මැයි මස 07 වන දින මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එෆ්. එම්. සවාහිර් මහතා විසින් සහතික කරන ලද අංක 1600 දරන ඇටර්නි බලපත්‍රයෙන් මා විසින් මහනුවර, මාවිල්මඩ පාර, අංක 45/5 හි පදිංචි මොහොමඩ් ලෙබ්බේ මොහොම්මදු සබ්රි යන අයට පවරන ලද ඇටර්නි බලය අවලංගු කර බලරහිත කරන ලද බවයි.

මින් ඉදිරියට මා ගැන හෝ මා වෙනුවෙන් ඉහත නම් සඳහන් මොහොමඩ් ලෙබ්බේ මොහොම්මදු සබ්රි යන අය විසින් ක්‍රියාත්මක කරනු ලබන නීතිමය හෝ වෙන යම් ක්‍රියාවක් පිළිබඳව කිසිම වගකීමක් මා භාර නොගන්නා බව ද මෙයින් ප්‍රකාශ කරමි.

රෙමිගියෝ පලෝනි,

2007 පෙබරවාරි මස 10 වැනි දින,
අංක 26/9, මාවිල්මඩ පාර,
මහනුවර.
05-43

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

නුගේගොඩ, ස්ටැන්ලි තිලකරත්න මාවතේ පදිංචි චිත්‍රානි මානෙල් පෙරේරා විවාහයට පෙර විජේවංශ, කොළඹ 09, කැටවලමුල්ල පටුමගේ, අංක 127/6A ඒ හි පදිංචි සීතා දිමන්ත සහ බත්තරමුල්ල වටරවුම පාරේ අංක 16 හි පදිංචි නිහාල් ද සිල්වා වන අප චන්ද්‍රලතා හේවාවසම් අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද අංක 3028 හා 1995.07.18 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් දොඩන්දූව, අගතුඩුව හි පදිංචි වල්පිට විතානගේ ආරියරත්න අපගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරන ලද පත්වීම වර්ෂ 2007 අප්‍රේල් මස 11 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බව මෙයින් දැනුම් දෙමු.

05-74

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## මහජන බැංකුව - අලව්ව ශාඛාව

අලව්ව ප්‍රාදේශීය සභා සීමාව තුළ

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුකහ දකුණ කෝරළේ, දඹදෙණි හත්පත්තුවේ, අලව්ව ප්‍රාදේශීය සභා බල සීමාවේ, පරමාඋල්ල නමැති ගමේ පදිංචිව, ඉන්නාවත්ත *හෙවත්* පදිංචිව හිටිනාවත්ත නමුත් ඉන්නාවත්ත නොහොත් හිටිනාවත්ත ලෙස ලියාපදිංචි වී ඇති ඉඩමට සාදා ඇති අංක 738 සහ 1993.06.27 දින දරන පිඹුරේ සඳහන් ලොට් අංක 4 ලෙස විශාලත්වය අ. 0, රූ. 0, පර්. 18.4ක් විශාල ඉඩම සහ නිවස මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2007.06.20 දින පෙ. ව. 11 ට පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2003.12.19 දින ද, දිනමිණ පුවත් පතේ ද, 2004.03.15 දින දී ද, ඩේලිනිව්ස් පුවත් පතේ 2004.03.17 දින දී ද, තිනකරන් පුවත් පතේ 2004.03.15 දින දී ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– අලව්ව නගරයේ සිට ගිරිඋල්ල පාරේ කි. මී. 2ක් ගිය පසු පරමාඋල්ලෙන් දකුණට හැරී පන්සල පාරේ මීටර් 200ක් ගොස් ගුරු පාරේ

මීටර් 50ක් ගියපසු පාරේ දකුණු පසින් මෙම ඉඩම හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මහජන බැංකුව, කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 037-2222453 ෆැක්ස් අංකය: 037-2222338

හිමිකම් හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල (සාමවිනිසුරු),
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු,

අංක 28, නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත,
කුරුණෑගල.
දුරකථන අංක : 037-2220062.

05-71

---

## සීමාසහිත සෙලාන් බැංකුව - මහනුවර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### පදිංචියට සුදුසු ඉතා වටිනා දේපලක්

යටිනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුල කිරිබත්කුඹුර ගමේ පිහිටි " බෝන් බෑක් එස්ටේට්" නැමැති ඉඩමෙන් බෙදූ ලොට් 72 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 25. (ලොට් 73, 41, 1, 2, 4, 3 දරන ඉඩම් උඩින් හා දිගේ පොදු මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය ද සමග )

මෙම දේපල මහනුවර පදිංචි සරත් බන්දුලසිරි ද මෙල් බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම.*– මහනුවර කඩුගන්නාව මහා මාර්ගයේ කි. මී. 7.5ක් පමණ 108/2 බෝක්කුව දක්වා පැමිණ වමට හැරී විදුලිබල මණ්ඩල උප කාර්යාල පාරේ මීටර් 700ක් ගමන් ගෙන දකුණට හැරෙන්න. මෙම පාරේ මීටර් 200ක් පමණ ගිය විට වම් දෙසින් හමුවන අඩි 12 ක් පමණ පළල පාරේ කෙළවර දක්වා ගිය විට අදාළ දේපල පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.12.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද,* 2006.12.08 වැනි දින ලංකාදීප, ඩේලිමිරර් පුවත්පත් හා 2006.12.22 වැනි දින වීරකේසරි පුවත්පත ද බලන්න.

2007 ක් වූ මැයි මස 21 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*–විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු හා ඝෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701291, 011-4701284, 011-2456258, 0777-736452.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 432/1, මවුන්ට් ප්ලසන්ට් ගාර්ඩින්ස්,
බෝවලවත්ත පාර,
හීරැස්සගල,
මහනුවර.

දුරකථන අංක : 081-2211025, 071-4755974 071-2755974
ෆැක්ස් අංකය : 081-2211025

05-77/1

---

## කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් –ගාල්ල කොටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් 2003 අප්‍රේල් මස 03 වන දින සාදන ලද අංක 7167 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩගම පිහිටි

දළුත්ගහකැලේ ඉඩමේ ගොඩනැගිලි සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් "A" දරන අක්කර තුනයි, රූඩ් එකක් (අ. 3, රූ. 1, ප.0) විශාල ඉඩම වේ.

බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් 2003 අප්‍රේල් මස 03 වන දින සාදන ලද අංක 7167 දරන පිඹුර පරිදි එකී ගොඩගම පිහිටි දළුත්ගහකැලේ ඉඩමේ ගොඩනැගිලි සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් "බී" දරන අක්කර එකයි, රූඩ් දෙකයි, පර්චස් තිහක් (අ. 1, රූ. 2, පර්. 30) විශාල ඉඩම වේ.

වතුදුරගේ සුනීතා නාලන්දනී ද සිල්වා සහ මහගොඩගේ නිමල්සිරි ණයකරුවන් හා උකස්කරුවන් හැටියට ද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස්කරන ලද ඉහත සඳහන් කළ දේපළ, වර්ෂ 2007 ක් වූ මැයි මස 29 වන දින ප.ව. 1.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.03.17 දින *රජයේ ගැසට් පත්‍රයේ ද*, දිවයින, අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2007.05.04 වන දින *රජයේ ගැසට් පත්‍රයද*, දිවයින සහ අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*– ගාල්ල කොළඹ මාර්ගයේ හික්කඩුව බස් නැවතුම්පලේ සිට කොළඹ දෙසට සැතපුම් 04 ක් පමණ ගිය විට කහව නගරය හමුවේ. එතැනින් දකුණට හැරී හැතැක්ම 02 ක් පමණ ගිය විට මීටියාගොඩ හන්දිය හමුවේ. එතැනින් දකුණට හැරී අළුත්වලට යන මාර්ගයේ සැතපුම් 1 1/4 ක් පමණ ගියවිට අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත. මෙය පන්සලට යන මාර්ගයට මුහුණලා පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකක් (01%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2000,
05. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළතදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන ශාඛාවේ හෝ ගාල්ල කොටුව ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක මහතා,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්, කොළඹ
වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය, බලයලත්
ජොෂ්ඨ වෙන්දේසිකරු, රාජ්‍ය බැංකු සහ වාණිජ බැංකු

අංක : 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/පැක්ස් : 2445393

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 22, පල්ලිය විදිය,
කොටුව
ගාල්ල
දුරකථන අංක : 091-2242771
091-2232223
091-2234377
fපැක්ස් අංකය : 091-2242770

05-85

## ඩී. එෆ්. සී. සී. බැංකුව
## (පෙර ලංකා සංවර්ධන මුදල් සංස්ථාව)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

අගනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක කේ. ජී. හියුබට් පෙරේරා විසින් සාදන ලද අංක 2999 හා 1984.07.28 වන දින දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මැදපත්තු සියනෑ කෝරළේ, ඉහළ ඉඹුල්ගොඩ ග්‍රාමයේ පිහිටි මූණමල්ගහ කුඹුර ඉඩමේ ගොඩනැගිලි සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසේ ප්‍රමාණය (අ. 0, රූ. 0, පර්. 6) හෝ (හෙක්ටයාර් 0.0153), "අමරසිරි මල් ශාලාව", යන නාම විලාශය සහ ආයතනය යටතේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කොට්විල කංකානමලාගේ ධර්මසේන විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, වර්ෂ 2007 ක්වූ මැයි මස 25 වන දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිකරු විසින් වෙන්දේසිය නතර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම මුදලින් ගෙවිය යුතු යි.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා ගාස්තුව සියයට එකක් (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2000,
05. ලිපිකරු සහ සෝෂක ගාස්තුව රු. 500,
06. ප්‍රචාරක වියදම් සඳහා වැය කරන ලද මුළු මුදල,
07. ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන සියයට අනුව (90%) ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බද්ද, තීරු බද්ද හෝ වෙනත් බදු හා ගෙවීම් නිකුත් කළ දින සිට දින 30 ක් තුළ දී ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහාන් ඩී. එෆ්. සී. සී. බැංකුවේ දුරකථන අංකය 2442442 ට අමතන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා
අධිකරණය, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 2445393

05-86

කොළඹ දිසා අධිකරණයේ දී ය.

කොළඹ 03, අංක : 28, ශාන්ත මයිකල් පාර, මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්(පෙර අංක : 189, ගාලු පාර, කොළඹ (03)

.......................... පැමිණිලිකරු.

නඩු අංකය : 16867/එම්. බී.

*එදිරිව*

කන්දගේ දොන් අමරදාස,
ලක් සෙවන හාඩ්වෙයාර් ස්ටෝර්ස්,
අංක : 790, දඹුලුගම හන්දිය,
දඹුල්ල

..............................විත්තිකරු

ඉහත අංක දරන නඩුවේ ඇතුලත් කර තිබෙන තීන්දු ප්‍රකාශය මගින් රුපියල් විසි එක් ලක්ෂ අසූහය දහස් හයසිය තිහයි ශත විසි තුන (රු. 2,186,630.23) ක මුදලක් සහ ඒ සඳහා 1997 අගෝස්තු 1 වන දින සිට මුදල සම්පූර්ණයෙන් ගෙවනතුරු වර්ෂයකට සියයට තිහ (30%) බැගින් පොලියද සමග ගෙවිය යුතු බව නියෝග කර ඇති බැවින් ද,

ඉහත සඳහන් මුදල අයකර ගැනීම සඳහා පැමිණිලිකාර බැංකුවට උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ විස්තර කර තිබෙන ඉඩම හා පරිශ්‍රය (එහි පිහිටි විශාල ගොඩනැගිල්ලද සමග) ඒ තුළ පිහිටි අන් සියලුම දේවල් සමග බැඳී ඇති බව හා වෙන්දේසි කල හැකි බව එකී තීන්දු ප්‍රකාශය මගින් තව දුරටත් නියෝග කර ඇති බැවින් ද,

ඉහත සඳහන් මුදල තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස දෙකක් (2) ඇතුලත ගෙවීම ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැහැර හැරියහොත් තීන්දු ප්‍රකාශයේ විධානයන් ප්‍රකාර හා උකස් පනතේ විධි විධාන වලට අනුකූලව පැමිණිලිකාර බැංකුවට උකස් කරන ලද හා මෙහි පහත උපලේඛනයේ විස්තර කර තිබෙන දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙම අධිකරණය මෙම අධිකාර පත්‍රය මගින් මාව පත්කර සංස්ථාපනය කර බලය පවරා දී ඇති බැවින් ද,

ඉහත සඳහන් කරුණු ප්‍රකාර මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර තිබෙන දේපල වර්ෂ 2007 ක් වූ මැයි මස 25 වන දින පූ.භා. 11.30 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුරු වගම්පනහ, පල්ලේසිය පත්තුවේ, දඹුල්ල ග්‍රාමයෙහි, දඹුල්ල ත්‍රිකුණාමලය පාරේ පිහිටා ඇත්තාවූද, දැනට අනුරාධපුර පාරේ වරිපනම් අංක 790 දරන්නාවූද, බලයලත් මිනින්දෝරු කේ. නඩරාජා මහතා විසින් සාදන ලද අංක 2117 හා 1994.09.28 වන දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් විස්සකින් (අ. 1, රූ. 1, පර්. 20) යුක්ත වූද උතුරට : කේ. එම්. කරුණාරත්නට අයිති මේ ඉඩමේ ඉතිරි කොටසින්ද, අංක 258 දරන පිඹුරේ අංක 2 බිම් කැබැල්ල ද මෙහි අංක 1 ඒ බිම් කැබැල්ලෙන්ද, නැගෙනහිරට : අල්විස් අප්පුහාමිට අයත් ඉඩමද, දකුණට : මයිකල් කුරේ ට අයත් ඉඩම ද, බටහිරට : ඒ. ඩී. එම්. එච්. බණ්ඩාරට අයත් බවට වැරදි ලෙස ප්‍රකාශ කර ඇති එහෙත් නිවැරදිව ත්‍රිකුණාමලයේ සිට දඹුල්ල දක්වා වූ ප්‍රධාන පාරෙන්ද මායිම් වූ ද, මල්ලගවයාය *හෙවත්* දංගවිල්ල යාය යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී බලයලත් මිනින්දෝරු කේ. නඩරාජා මහතා විසින් සාදන ලද අංක : 2117 හා 1994.09.28 වන දින දරන පිඹුරේ 1 කී බිම් කැබැල්ල වශයෙන් සලකුණු කොට ඇති බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේද වේ.

මෙකී ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ඩී. 285/244 හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපලට පිවිසීම* .– දඹුල්ල - ත්‍රිකුණාමලය පාරේ බැරියර් හන්දියේ යුධ හමුදා මාර්ග බාධකය අසල අංක 790 දරන ලක්සෙවන හාඩ්වෙයාර් ස්ටෝර්ස් ව්‍යාපාරික ගොඩනැගිල්ල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.– වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ක් අධිකරණයෙන් අනුමත කර ඇති ගාස්තු චක්‍රය අනුව වෙන්දේසිකරුගේ ගාස්තුද, රජයේ ගාස්තුද, වෙන්දේසිය සඳහා වූ සියලුම වියදම්ද, එවෙලේම වෙන්දේසිකරුට ගෙවිය යුතුය. තවද, ගැණුම් මිලෙන් ඉතිරි මුදල දින තිහක් (30) ඇතුලත අධිකරණයේ තැන්පත් කල යුතුය.

වැඩි විස්තර සඳහා කළමණාකරු :- නීති නිළධාරිනි, මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්, අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03. (14 වන මහල).

දුරකථන අංක : 4711781.

ඉන්දු හේවාවිතාරණ,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
වෙන්දේසිකරු හා සාම විනිසුරු,

අංක : එච්. 1/16, සාංචි ආරච්චිවත්ත,
කොළඹ 12.
දුරකථන අංක : 0724459575, 0773186624

05 - 91

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* - (වාර්ෂික)

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ ගාස්තුව | | තැපැල් (මෙරට) | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2007**

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| මැයි | 2007.05.04 | සිකුරාදා | 2007.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.11 | සිකුරාදා | 2007.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.18 | සිකුරාදා | 2007.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.25 | සිකුරාදා | 2007.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2007.06.01 | සිකුරාදා | 2007.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.08 | සිකුරාදා | 2007.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.15 | සිකුරාදා | 2007.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.22 | සිකුරාදා | 2007.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.29 | සිකුරාදා | 2007.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2007.07.06 | සිකුරාදා | 2007.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.13 | සිකුරාදා | 2007.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.20 | සිකුරාදා | 2007.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.27 | සිකුරාදා | 2007.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.